# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2323/40 - 2023 මාර්තු මස 17 වැනි සිකුරාදා - 2023.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වන හා 5 වන වගන්තිය යටතේ නියමය

01. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *(I) වන තීරය* | | | | *(II) තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩයේ විස්තරය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1 | 04.08 | | අලුත්, වියලූ, වාෂ්පයෙන් හෝ වතුරෙන් තම්බා පිසින ලද, කැට කළ, හිමායිත කළ හෝ වෙනත් ආකාරයකින් පරිරක්ෂණය කළ, සීනි හෝ වෙනත් රසකාරක අඩංගු කළ හෝ නොකළ, කටුව රහිත කුරුලු බිත්තර සහ බිත්තර කහමද | |
| | | 0408.99 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 1,300 |

02. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත උපලේඛනයේ දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0408.99 යටතේ වර්ගීකරණය වන අධිශීතකළ දියරමය සම්පූර්ණ බිත්තර ආනයනය කිරීමේ දී අදාළ වන කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 1,300 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝ ග්‍රෑමයක්


1A - PG 6263 — 431 (2023/03)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සඳහා රු. 200 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, අනුමත කළ ප්‍රමාණය හා අදාළ නියමයන් හා රෙගුලාසිවලට යටත්ව, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

03. මෙම නියමය, 2023 මාර්තු මස 18 වැනි දින සිට ආරම්භ වන මාස දෙකක (02) කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.